**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව** **දිනය - 2022.06.21** **වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා 2.ගරු උප සභාපති - ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3.- ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා 4.- කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 - ජී.මි.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා 6.- ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7- ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා 8- ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9.- කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා 10.- එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11.- ඒ.ජී.තිලකරත්න මැතිතුමා 12.- ඩී.ඒ.එල්.සුනිල් දෙයියාගල මැතිතුමා
13.- පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා 14. - එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
15- එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා 16.- ඩී.පී ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
17- ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා 18.- ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
19 - එස්.සුදර්ශන් මැතිතුමා 20.- එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා මැතිනිය
21.- කේ.මධුෂිකා ප්‍රශාදිනි ජයසිංහ මැතිනිය 22.- එම්.ඩී.පී.ඥානවති මැතිනිය
23- ටී.ඉමල්කා සංජීවනි මැතිනිය 24.- බී.ජී.සීතා රංජනි මැතිනිය
25. ඒ.පී.ඩබ්ලිව්.එම්.පී.ඩයනා උදයංගනි මැතිනිය 26.- එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා 2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කමල්රාජ් මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහිකිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රිතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රිතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා. රටේ පවතින ඉන්ධන අර්බුදයත් සමඟ නියමිත දිනයේ සභා රැස්වීම පැවැත්වීමට නොහැකි වීම පිළිබඳව මාගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.නමුත් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය අපේක්ෂා කරනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.05.20 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.05.20 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.05.20 වන දින පැවති මහ සභා රැස්වීම වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන -**

*. 2022 වාර්ෂික සැලැස්මට අනුව ක්‍රියාත්මක කරනු ලබන ආගමික ස්ථාන මූලික කරගත් වසංගත රෝග නිවාරණ වැඩ සටහනක් 2022.06.23 බ්‍රහස්පතින්දා දින පෙ.ව.9.30 ට කිතුල්ගල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ මූලික කරගනිමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.ඒ සඳහා ගරු මන්ත්‍රිතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙස ප්‍රකාශ කර සිටිනවා.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම -**

*.සීපෝත් - යටියන්තොට මාර්ගයේ ජයවින්දාගම සිට පූනුගල දක්වා කාපට් ඇතිරිම මේ වන විට අතරමග නතර වී ඇත. එම කාපට් කිරිමේ ආයතනය ද මේවන විට එම සංවර්ධනය නතර කරමින් යන්ත්‍ර සූත්‍ර හා සේවකයින් ද ආපසු රැගෙන ගොස් ඇත.දැනට මෙම මාර්ගයේ වාහන ගමන් කිරිමට ඉතා අසීරු තත්වයකට පත්ව ඇත.එම මාර්ගයේ ගමන් ගැනීමෙන් අනතුරුද සිදූ විය හැකි බවත් මෙය කඩිනමින් සකස්

කර ගැනිමට විසඳුමක් ලබා ගැනීමත් සඳහා වූ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඒ.පී.ඩබ්.එම් ඩයනා පාලමකුඹුර මැතිනියගේ ලිපිය දැන ගැනිම සඳහා ඉදිරිපත් කරමි.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**(ඉ) කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා (ඉ) 01.** යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ භාවිතා කරන ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සේවා ගිවිසුම් 2022.06.28 දිනෙන් අවසන් කිරිමට නියමිතව ඇත.ඒ වෙනුවෙන් ටයිම්කෝ සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙතින් සේවා ගිවිසුමක් ඉදිරිපත් කර ඇති අතර ඒ වෙනුවෙන් රු.19,500.00 ක සේවා ගාස්තුවක් ගෙවා ,සේවා ගිවිසුමකට ඇතුළත් වීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** (ඉ) 02. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු අංක SGZA 0324 දරන බොබ්කැට් යන්ත්‍රය සේවා කිරිම සඳහා නියෝජිත ආයතනය වන ඩැක්ස් ඉන්ජිනියරින් කම්පැනි සමාගම විසින් රු . 35,000.00 ක් වටිනා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.එම මුදල් ගෙවා සේවා කටයුතු සිදු කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා (ඉ) 03.** යටියන්තොට ප්‍රාදේශීය සභා බල සීමාවේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ දේපලක පහත අවස්ථාවන් යටතේ වාර්ෂික වටිනාකම් වෙනස් වීම නිරීක්ෂණය වන විට එම නව වාර්ෂික වටිනාකම් තක්සේරු කිරිම සඳහා ,1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140 (1) වගන්තිය අනුව සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතියට යටත්ව ආදායම් පරීක්ෂක කේ.එම් ගුණතිලක මයා පත් කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනාව කරනවා.

1. ඉඩම් ලෙස පවතින දේපලවල ගොඩනැගිලි ඉදිකිරිම
2. පවතින ගොඩනැගිලිවල නවීකරණයන් නිසා සිදුවන වාර්ෂික වටිනාකම සංශෝධනය
3. පවතින ගොඩනැගිලි දේපළවල නවීකරණය නිසා සිදුවන ඒකාබද්ධ කිරිම
4. පවතින ගොඩනැගිලි දේපළවල නවීකරණය නිසා සිදුවන උප අංක ඇතිවීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** (ඉ) 04. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සේවයෙහි නියුතු පහත නම් සඳහන් මහත්ම මහත්මින් විසින් ආපදා ණය ඉල්ලුම් කර ඇති අතර ගෙවීම් කිරිමට මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

1.කේ.එම්.ගුණතිලක මහතා - රු.135,415.00
2.ඩබ්.ඒ.ජානක වීරතුංග මහතා - රු. 124,880.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 05.** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරීමට යෝජනා කරන ලද පහත සඳහන් ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියත් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01. කොස්කඳගේන නිහාල් ජිනදාස මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම - රු.350,000.00
02. හල්ගොල්ලවත්ත මැද ලැයිමට යන මාර්ගය හා මෝගන් සගිස්නා ලැයින් පේළියේ මාර්ගය සංවර්ධනය කිරීම
 රු.350,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.නිමල් කුමාරසිරි මැතිතුමා ඔබගේ යෝජනාව ගරු මහ සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා** (ඉ) 06. රටේ පවතින ආහාර අර්බුදය විසඳීම සඳහා අපට දායක විය යුතු ආකාරය පිළිබඳව තීරණයක් ලබා ගැනීමට මා යෝජනා කරනවා.

01. නාගස්තැන්න වතුයායෙන් අක්කර 50 ලබාගෙන ගොවිපළක් ආරම්භ කිරීම
02.වතුකරයේ ජනතාව දැඩි ආර්ථික අසීරුතාවයකින් පෙළෙන බැවින් ඒ අයට ද සහනාධාරයක් ලබා දීමට කටයුතු කරන ලෙස අදාල ආයතන දැනුවත් කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකොන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.අපට අක්කර 50 සභාවට පවරාගෙන වගා කරන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුම** ගරු සභාපතිතුමනි, නාගස්තැන්න වතුයායෙන් ඉඩම් ගන්නවානම් ඒකට වෘත්තීය සමිති තියෙනවා.අදාළ නිලධාරින් ඉන්නවා එයාලව දැනුවත් කරන්න ඕන.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත (ඉ) 06 යෝජනාවට අනුව අදාල ආයතන ලිපි මගින් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 06 යෝජනාවට අනුව අදාල ආයතන ලිපි මගින් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**( සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා ඔබගේ යෝජනාව ගරු මහ සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා** **(ඉ) 07.** පහළ ගරාගොඩ පේරකොටුව පාරේ සතියකට දවසක් කුණු ට්‍රැක්ටරය යවා කුණු එකතු කරගෙන ගැනීමට සහයෝගයක් දක්වන ලෙස මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු මන්ත්‍රීතුමනි,මේ දිනවලනම් කුණු ට්‍රැක්ටරය එවන එක අමාරුයි ඉන්ධන සපයා ගැනීම විශාල ගැටළුවක් .කුණු වෙන්කරලා දෙන්න ප්‍රදේශවාසීන් දැනුවත් කරන්න.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 07 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 08. 2022 දෙවන අර්ධ වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ඩී.පී.ඥානවති මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 09. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිරිකොහුතැන්න ග්‍රාම නිලධාරි වසමේ ටවර් එක පටන් ගන්නා ස්ථානයේ පවතින අවදානම් සහිත බෑවුම් සඳහා සුදුසු පිළියම් තීරණය කර ගැනිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි,ටවර් එක පටන් ගන්න ස්ථානයේ අවධානම් සහිත බෑවුමක් තියෙනවා.මෙතන අනතුරු සිදුවිය හැකි ස්ථානයක් මෙතන ආරක්ෂිත වැටක් සවි කළ යුතුයි.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඉහත ස්ථානයේ ලොකු බෑවුමක් තියෙනවා මෙතන අනතුරු සිද්ද වෙන්න පුළුවන්,මෙම ස්ථානයට ආරක්ෂිත වැටක් යොදන්න පුළුවන්නම් හොඳයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව (ඉ) 09 සඳහන් ස්ථානයේ ආරක්ෂිත වැටක් යෙදිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 09 යෝජනාවට අනුව ආරක්ෂිත වැටක් ඉදි කිරිමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 10. කලටුවාව කාබනික පොහොර මධ්‍යස්ථානයේ හරිතාගාරය සකස් කිරිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය 2022.06.07 වන දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව ග්‍රීන් ඇග්‍රෝ කෙමිකල්ස් ආයතනය වෙතින් සපයා ගැනිමටත් ඒ වෙනුවෙන් රු.144,430.00 ක මුදල ගෙවීම් කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතියට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 11. 2022 මැයි මස ගෙවීම් වාර්තාව ( රු.17,936,265.74 ) ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් නන්දසේන මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක11)**

**හදිසි යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 12.යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර් සහ ටියුබ් 2022.06.15 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් පහත සඳහන් පරිදි සපයා ගැනීමටත් ,ඒ වෙනුවෙන් ගෙවීම් කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | ටයර් සහ ටියුබ් වර්ගය | ප්‍රමාණය | ඒකක මිල (රු) | මුළු මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | 13.6 X 28 ටයර් | 2 | 128,500.00 | 257,000.00 |
| 2 | 13.6 X 28 ටියුබ් | 2 | 12,500.00 | 25,000.00 |
| 3 | 650X 16 ටයර් | 2 | 31,770.00 | 63,540.00 |
| 4 | 600X 16 ටයර් | 6 | 22,600.00 | 135,600.00 |
| | | | | 481,140.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 13. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපල කඩ කාමර 22 සඳහා මාසික කුලිය තක්සේරු කර වාර්තාව එවා ඇත.පහත සඳහන් පරිදි එම තක්සේරු වාර්තාවට අනුව 2022 අගෝස්තු මස සිට නව තක්සේරුවට අදාල බදු මුදල අයකර ගැනීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට මා යෝජනා කරනවා.
*තක්සේරු වාර්තාවේ වූ සඳහන

| කඩ අංකය | මාසික බදු කුලිය | | කඩ අංකය | මාසික බදු කුලිය |
|---|---|---|---|---|
| 1 | 12,750.00 (රුපියල් දොලොස් දහස් හත්සිය පනහයි ) | | 11 | 7,250.00 ( රුපියල් හත්දහස් දෙසිය පනහයි ) |
| 2 | 12,750.00 (රුපියල් දොලොස් දහස් හත්සිය පනහයි ) | | 12 | 8,750.00 ( රුපියල් අටදහස් හත්සිය පනහයි ) |
| 3 | 12,750.00 (රුපියල් දොලොස් දහස් හත්සිය පනහයි ) | | 13 | 8,750.00 ( රුපියල් අටදහස් හත්සිය පනහයි ) |
| 4 | 12,750.00 (රුපියල් දොලොස් දහස් හත්සිය පනහයි ) | | 14 | 11,500.00 ( රුපියල් එකොලොස් දහස් පන්සියයි ) |
| 5 | 12,750.00 (රුපියල් දොලොස් දහස් හත්සිය පනහයි ) | | 15 | 11,500.00 ( රුපියල් එකොලොස් දහස් පන්සියයි ) |
| 6 | 15,000.00 (රුපියල් පහලොස් දහසයි ) | | 16 | 11,500.00 ( රුපියල් එකොලොස් දහස් පන්සියයි ) |
| 7 | 6,500.00 (රුපියල් හයදහස් පන්සියයි ) | | 20 | 10,250.00 (රුපියල් දසදහස් දෙසිය පනහයි ) |
| 8 | 7,500.00 (රුපියල් හත්දහස් පන්සියයි ) | | 20 A | 10,250.00 (රුපියල් දසදහස් දෙසිය පනහයි ) |

* මෙම තක්සේරුව වාර්තා කරණුයේ අදාළ දේපළ යථා තත්වයෙන් පවත්වාගෙන යැමට අවශ්‍ය අළුත්වැඩියා හා නඩත්තුකිරිමේ වියදම්,වරිපනම් බදු ගෙවීම් අයිතිකරු විසින් කළ යුතුය යන පදනම මත බැව් දන්වා සිටින අතර ,ඉදිරි වසර තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන බවද,වැඩිදුරටත් දන්වා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් නව තක්සේරු වාර්තාව අනුව අගෝස්තු මස සිට අය කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**( සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 14. ගෝනගමුව මිණිගම්මන මාර්ගයේ පාසල අසල පැති බැම්ම ඉදි කිරිම සඳහා 2021.12.14 දින ගරු මහ සභාවේ ඇස්තමේන්තු අනුමැතිය මත 2021.12.21 දින යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතිය සමඟ ගිවිසුම් ගතව ඇත.විවිධ සාධාරණ හේතු මත වැඩ අවසන් කිරිමේ කාලය 2022.05.20 දිනට නියමිතව තිබිණි.නමුත් රටතුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරිමට අදාළ ද්‍රව්‍ය සපයා ගැනිමට නොහැකි බැවින් ඇස්තමේන්තු මිල සංශෝධනය හෝ වෙනත් විකල්පයක් යටතේ ව්‍යාපෘතිය අවසන් කිරිමට ගිවිසුම්කරු විසින් 2022.05.20 දින ලිපියක් මඟින් ඉල්ලීම් කර ඇත.ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ඉතිරි කොටස අවසන් කිරිම සඳහා දැනට අනුමත ඇස්තමේන්තුව වෙනුවට එම ඇස්තමේන්තු වටිනාකමට යටත්ව සකස් කර ඇති රු.1,500,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති ඒ.වී රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය විමසා කටයුතු කිරිම සුදුසුයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව කොන්ත්‍රාකරුගේ එකඟතාවය මත මෙය ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත ක්‍රියාත්මක කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 14)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 15. අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩු අංක 22575/පී (යටියන්තොට සතිපොල) නඩුව සඳහා පැමිණිලිකාර පාර්ශවය විසින් කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයේ CS/HCCA/LA/125/2022 නඩු අංකය යටතේ නඩුවක් ගොනු කර ඇත.යටියන්තොට ප්‍රාදේශීය සභාව 14 වන විත්තිකරු කර ඇති මෙම නඩුවේ නීතිඥ කටයුතු මෙම සභාවේ අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ රොහාන් සහබන්ධු මහතාට පැවරීමටත් නඩුව සම්බන්ධ කටයුතු සඳහා එම මහතා සපයන සේවාව වෙනුවෙන් ගෙවීම් කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 15)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා ඔබගේ යෝජනාව ගරු මහ සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** (ඉ) 16.ගරු සභාපතිතුමනි, රටේ පවතින හදිසි අවශ්‍යතාවය යටතේ ආහාර හිඟයක් මතුවන බැවින් යටියන්තොට ප්‍රාදේශිය සභා සීමාව තුළ වසම් 32 සඳහා වගා සංග්‍රාමයක් ආරම්භ කිරිම සඳහා කටයුතු සලසා දී එයට අවශ්‍ය මුදල් ප්‍රාදේශිය සභාව හරහා ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම ප්‍රාදේශීය සභාව ආදර්ශයක් කර ගනිමු. සභාව පිටුපස හා යාඩ්එක ඉදිරිපස,ආදාහනාගාර භූමියේ වගා සංග්‍රාමයක් ආරම්භ කරමු.බහුකාර්යය සේවකයින් මේ සඳහා යොදවා ගනිමු.ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු වසම් වල සිටින රාජ්‍ය නිළධාරින් වගා කටයුතු ආරම්භ කරන්න මූලිකත්වය ගත යුතුය.නමුත් තවමත් ආරම්භකරලා නෑ රාජ්‍ය නිළධාරින් මේකට වග කියන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි,දැනටමත් වගා කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වෙනවා.වසම් මට්ටමින් මේක ක්‍රියාත්මක වෙනවා.ඒ වගා කරන අයට පොහොර ටික ලබා දෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, වගා සංග්‍රාමයක් ආරම්භ කල යුත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් එහි ඇමතිවරයෙක් ඉන්නවා .එතුමා මේකට මැදිහත්වෙලා මේක ක්‍රියාත්මක කරන්න ඕන.රාජ්‍ය නිලධාරින්ට මේකට වග කියන්න බෑ.ඒ අය වැඩ කරන්නේ එයාලට පවරලා තියෙන රාජකාරිය.නමුත් අපි හැකි ආකාරයට වවාගන්න ජනතාවට සහය වෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ දිල්සානි ප්‍රසාදිකා මැතිනිය** ගරු සභාපතිතුමනි, මේ දිනවල අදාල ගොවි මහතුන් ගෙන්වාගෙන බීජ ලබා දීමේ වැඩපිළිවෙලක් සිදු කරනවා.ඒ සඳහා ප්‍රාදේශීය සභාවෙන් යම් දායකත්වයක් ලබා දෙන්න පුළුවන්නම් හොඳයි.මේ අවස්ථාවේ පක්ෂ භේදයකින් තොරව මිනිස්සු වෙනුවෙන් යම් දෙයක් කරන්න ඕන.රජයෙන් ගෙනයන මේ වැඩපිළිවෙළට අපිත් සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා පාලමකුඹුර මැතිනිය** ගරු සභාපතිතුමනි, වසමකින් වගා කටයුතුකරන කීප දෙනෙකු තෝරා ගනිමු.අවශ්‍ය පසුබිම සකස් කළ පසු බීජ හා පොහොර ලබා දෙමු.සතියකට වරක්වත් කමිටුවක් මගින් අධීක්ෂණය කරන්න වැඩ පිළිවෙළක් සකස් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් .ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි. ඉදිරියේ දී ආහාර හිඟයක් ඇති වෙනවා .අපි ඒකට මුහුණ දෙන්න ඕන.පළමු අදියර වශයෙන් එක ගමකින් 05 දෙනෙකු තෝරා ගනිමු.ඒ ඒ වසම් වල ගරු මන්ත්‍රිතුමන්ලාගෙන් යුත් කමිටුවක් පත් කරගනිමු.සති දෙකකට වතාවක් අධීක්ෂණය කරමු.මේ සිකුරාදා දින වන විට සෑම මන්ත්‍රිකෙනෙකුම වසමේ 05 දෙනෙකුගේ නම් ලබා දෙන්න.මේ අයට කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරි මහතෙකු ගෙන්වා වැඩමුළුවක් කර බීජ හා පොහොර ලබා දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, වසම් සංවර්ධනය සඳහා ලබා දෙන මුදලින් හෝ ජනතාවට වගා කරන්න අවශ්‍ය පහසුකම් ටික දෙමු. අවශ්‍ය පොහොර බීජ සභාව මගින් ලබා දෙනවානම් හොඳයි.

**ගරු උප සභාපති ඒ.වී රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි,වගා සංග්‍රාමය ආරම්භ කිරිමට සැලැස්මක් සකස් කළ යුතුයි.සභාව මගින් වගා කරුවන්ට පොහොර ටික හරි ලබා දෙන්න පුළුවන්නම් මේ අවස්ථාවේ ඔවුනට ලොකු හයියක්.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව සෑම මන්ත්‍රී කෙනෙකුම තම වසමේ වගා කිරිමට කැමති පුද්ගලයින් 05 දෙනෙකුගේ නම් මේ සතියේ සිකුරාදා දින වන විට ලබා දෙන්න.ඔවුනට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් වැඩ මුළුවක් පවත්වා බීජ හා පොහොර ලබා දීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව සෑම මන්ත්‍රිකෙනෙකුම තම වසමේ වගා කිරිමට කැමති පුද්ගලයින් 05 දෙනෙකුගේ නම් මේ සතියේ සිකුරාදා දින වන විට ලබා දෙන්න.ඔවුනට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් වැඩ මුළුවක් පවත්වා බීජ හා පොහොර ලබා දීම සඳහා ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 16)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩයනා පාලමකුඹුර මැතිනිය ඔබගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.පී.ඩබ්.එම්.පී.ඩයනා පාලමකුඹුර මැතිනිය** ( ඉ) 17. ගරු සභාපතිතුමනි, මලල්පොල වසමට අයත් පිදුරුවැල්ල ග්‍රාමයේ ඉදිකර තිබූ බෝක්කුව අධික වර්ෂාව නිසා කැඩී ගොස් ඇත.එය කඩිනමින් සකස් කර ගැනිමට සිලින්ඩර් දෙකක් සහ සිමෙන්ති කොට්ට දහයක් ලබා දීමට හැකිනම් ශ්‍රම දායකත්වයෙන් ගොඩනගාගත හැකි බව ගම්මුන් විසින් මා දැනුවත් කළේය.මේ සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මමත් මේ යෝජනාව සභාපතිතුමාට ඉදිරිපත් කළා.මෙම බෝක්කුව ගැලවී ගොස් දැනට වසර 1 2/1 ක් පමණ ගත වෙලා.මෙහි ගමන් ගන්නා ජනතාව ඉතාම අසීරුතත්වයකට පත් වෙලා ඉන්නේ ,මේක කරලා දෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා. එම යෝජනාවට අනුව රටේ පවතින තත්වයත් සමඟ මේ අවස්ථාවේ මුදල් යොදවන්න අමාරුයි.නමුත් මේ යෝජනා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඉදිරියේ දි ලබා දීමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **( සභා තීරණ අංක 17)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** *ගරු මන්ත්‍රීතුමනි,ඔබ සියළුම දෙනාගේම පහත ඉදිරිපත් කර ඇති කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ යෝජනා රටේ පවතින තත්වයත් සමග මේ දිනවල සිදු කිරීම අපහසු බැවින් පසුව එම කර්මාන්ත ඉටු කර ගනිමු.

01. දොබෙපොල ගමට පිවිසෙන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම ( අඩි 100 පමණ)
02.සීපෝත් පොදු සුසාන භූමියේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම ( රු.50000.00)
03.ගල්පාත ශ්‍රී සුමංගලාරාම පෙර පාසලේ ගොඩනැගිල්ලේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම ( රු.100,000.00)
04.පහළ ගරාගොඩ ඕවිට මාර්ගයේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම (රු.150,000.00)

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**
1.2022.03.02 වන දින පැවති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව
2.මිලදී ගැනීම කල් තබන ලද 2022.05.31 දිනැති ප්‍රසම්පාදන තීරණය

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**
01.2022 අප්‍රේල් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
02.2022 අප්‍රේල් මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
03.2022 අප්‍රේල් මාසයට අදාල අපේක්ෂිත සත්‍ය ආදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි,ගල්පාත තෙල්කුමුදුවල බස් රථය ධාවනය නොකිරීම නිසා පාසල් ළමුන් මෙන්ම මගීන්ද දැඩි අපහසුතාවයට පත්ව ඇත.අවිස්සාවෙල්ල ඩිපෝවට දැනුම් දෙන්න පාසල් වේලාව තුළ පමණක්වත් බස් රථය ලබා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, වැලිහෙලතැන්නේ උදේ 6.35 ට යන බස් එකත් ටික කාලයක සිට ධාවනය කෙරෙන් නෑ.මේක පාසල් ළමුන්ටත් ගම්මුන්ටත් ලොකු පාඩුවක් .මේගැනත් අවධානය යොමු කරන්න.

**ගරු උප සභාපති ඒ .වී රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතතිතුමනි, යටියන්තොට සිට කිතුල්ගල දක්වා මාර්ගයේ ගමන් කිරීමට ඉතාම අපහසුයි.මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කමල්රාජ් මැතිතුමා සහ ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කමල්රාජ් මැතිතුමා සහ ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, කිතුල්ගල ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගන්න පැමිණෙන ජනතාව මාර්ගය දෙපස පෙළගැසීම නිසා විශාල වාහන තදබදයක් ඇති වෙලා තියෙනවා.මේ තත්වය පාලනය කරගැනිමට සැලැස්මක් සකස් කරලා පොලිසියත් දැනුවත් කර මෙම ගැටළුව විසඳීමට කාරුණික වෙන්න.

*පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා කිතුල්ගල සහ යටියන්තොට ඉන්ධන පිරවුම්හලෙහි සිදුවන අකටයුතුකම් පිලිබඳව හා ඉන්ධන ඇතැම් පුද්ගලයින් විසින් අධික මිලට විකුණන බවත්,අත්‍යවශය සේවා සඳහා ඉන්ධන ලබා ගැනිමට හැකි වන පරිදි අදාළ පුද්ගලයින් සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා ගත යුතු බවත් පහත මන්ත්‍රීතුමන්ලා අදහස් පල කර සිටියහ.

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් විජේසූරිය මැතිතුමා

**ගරු සභාපතිතුමාගේ ස්තූති කථාව**

අද දින බොහෝ බාධක මැද සභාවට පැමිණිලා කෙතරම් අඩුපාඩු වුවත් නව ගොඩනැගිල්ලේ සභාව පැවැත්වීම පිළිබඳවත් කාර්යය මණ්ඩලයේ ප්‍රධානියාට ස්තූතිවන්ත වෙනවා.දැන් රටේ පවතින තත්වයත් සමග අනාගතය ගැන කියන්න බෑ.ඒ කෙසේ වෙතත් සභාවට පැමිණිලා සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්,ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් ,මාධ්‍ය ආවරණය සඳහා පැමිණි මාධ්‍යවේ දි මහත්වරුන්ටත් ගෞරවනීය ස්තූතිය පුද කරමින් ප.ව 01.00 ට මහ සභා රැස්වීම අවසන් කරන ලදි.